## ක්‍රියාකාරකම් පත්‍රිකාව

# ඒකකය 18

# අනතුරු හා ප්‍රථමාධාර





## එදිනෙදා මුහුණුදෙන අනතුරු හා ප්‍රථමාධාර දැනගනිමු

වයි.වි.ඒ නලින් දර්ශන

මො/ඔබ්බේගොඩ ද්විතීයික පාසල

නිවරදි පිළිතුර තෝරන්න

**01-** පුද්ගලයෙකු දියේ ගිලී සිටි විට බේරා ගත් පසු පළමුවෙන්ම පරික්ෂා කළ යුත්තේ,
1) රුධිර සංසරණය 2) ශ්වසන මාර්ගය 3) ශ්වසනය 4) ආබාධ

**02-** ක්ලාන්තය ඇතිවූ අවස්ථාවක නොකළ යුත්තේ,
1) තද ඇඳුම් බුරුල් කිරීම.
2) වාතාශ්‍රය හොඳින් ලැබීමට සැලැස්වීම.
3) උණුසුම් පානයක් බීමට දීම.
4) දිගා කරවන්නේ නම් පාද ඉහළට ඔසවා තැබීම.

**03-** පිළිස්සීමකදී කළ යුතු ප්‍රථමාධාරයක් වන්නේ,
1) ඇඳුමකට ගිනි ඇවිලුණි නම් වහා ජලය ඇති ස්ථානයකට දුවගෙන යා යුතුය.
2) පිළිස්සුනු ඇඳුම් ඉක්මණින් ඉවත් කර යුතුය.
3) මුලින්ම කළ යුත්තේ තද ඇඳුම්, මුදු ආදිය ඉවත් කිරීමය.
4) පිළිස්සුණු කොටස් මිනිත්තු 10ට වඩා ගලා යන ජලයට ඇල්ලිය යුතුය.

**04-** ප්‍රථමාධාර ලබාදීමේ අරමුණක් නොවන්නේ
1) රෝගියාගේ ජීවිතය බේරාගැනීම
2) ඉක්මනින් සුවය ලබාගැනීමට උපකාරවීම
3) රෝගීතත්වය බරපතලවීම වැලැක්වීම
4) රෝගියා සුව කිරීම

**05-** මූලික ජීවිතාධාර ලබාදීම සඳහා භාවිත කරන ක්‍රමය පිළිවෙලින් සදහන් වන්නේ
1) ACBDE 2)RICE 3) ABCDE 4)WHO

**06-** කෘත්‍රිම ශ්වසනය ලබාදිම සිදුකල යුත්තේ විනාඩියකට වාර
1) 75 කි 2) 100 ක් 3) 50 කි 4) 10 කි

**07-** පිළිස්සීමක ' ඇතිවිය හැකි අවස්ථාක් නොවන්නේ
1) හිරු එළියෙනි 2) තාපයෙනි 3) අයිස් මගිනි 4) විදුලිය මගිනි

**08-** පුද්ගලයෙකු අනතුරට පත් වී කොඳු ඇට පෙළට හානි වී ඇතැයි සැක අවස්ථාවක වෛද්‍යවරයෙකු වෙත ගෙන යා යුත්තේ ,
1) කොඳු ඇට පෙළ රෙදිවලින් ඔතාගෙනය.
2) පුටුවක වාඩි කරවාගෙනය.
3) ලෑල්ලක් උඩ තබාගෙනය.
4) ලී පතුරු තබා ඒ උඩ තබාගෙනය.

(2.1/2 x 08 = 20)

II කොටස

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01) ප්‍රථමාධාරයක් යනු කුමක්ද යන්න අර්ථ දක්වන්න (10)

02) ප්‍රථමාධාර ලබා දෙන්නෙකු සතු විය යුතු ගුණාංග 05 ක් ලියන්න (10)

03) ප්‍රථමාධාර ලබා දීමේ අරමුණු 4 ක් ලියන්න. (05)

04) ක්ලාන්තයක් ඇති වූ පුද්ගලයෙකුට දිය යුතු ප්‍රථමාධාර මොනවා ද? (05)

05) විදුලි සැර වැදීමකදී ඔබ ප්‍රථමාධාරකරුවෙකු ලෙස ක්‍රියා කටයුතු කරන ආකාරය පැහැදිලි කරන්න (10)

06) පුද්ගලයෙකුගේ රුධිර සංසරණය නැවතිය හැකි අවස්ථා 5ක් ලියන්න. (10)

07) ප්‍රථමාධාර ලබා දීමේ ABCDE ක්‍රමවේදයේ එක් එක් පියවර සඳහන් කරන්න (10)

08) පිලිස්සීමක් ඇති විය හැකි අවස්ථා 4ක් සඳහන් කරන්න (05)

09) ප්‍රථමාධාර පෙට්ටියක අඩංගුවිය යුතු දේවල් පහක් සඳහන් කරන්න (10)

(10) ප්‍රථමාධාර සහාය ලබාගත හැකි ආයතන 2 ක් සඳහන් කරන්න (05)